සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

கம்பனித் தோட்டங்ளை மறுசீரமைத்தல் தேயிலை மற்றும் இறப்பர் தோட்டங்ள் சார்ந்த பயிர்ச்செயகை தேயிலைத் தொழிற்சாலைளை நவீனமயப்படுத்துதல் மற்றும் தேயிலைமற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாடு இராஜாங் அமைச்சு

State Ministry of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion

කාර්යසාධන වාර්තාව
செயற்பாட்டு அறிக்கை
Performance Report
2021







08 වෙනි මහල, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල
08 ஆவது மாடி, செத்சிறிபாய - ஐஐ ஆம் கட்டம், பத்தரமுல்லை
8th Floor, Sethsiripaya - Stage II, Battaramulla



සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

2021 කාර්යසාධන වාර්තාව

08 වෙනි මහල
සෙත්සිරිපාය, අදියර **II**
බත්තරමුල්ල

2022 - ජූනි

පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01

1.1 හැඳින්වීම 01
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 02
1.3 ප්‍රධාන කාර්යයන් 03
1.4 සංවිධාන සටහන 04
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 05
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 05
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 05

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 06

විශේෂ,ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 06

03 පරිච්ඡේදය - 2020 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 11

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 11
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 13
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 14
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 16
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 16
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 17
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන 17
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 18
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමුණුම - 1) 18

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 19

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 19

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 20

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 20
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 21

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 23

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 23
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලබන ආකාරය 23
6.3 මානව සම්පත් සංවර්ධනය 23

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 24

01 පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකයට ඉමහත් දායකත්වයක් සපයනු ලබන වැවිලි ක්ෂේත්‍රය මඟින් තේ ප්‍රධාන කොටගත් භෝග රාශියක් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඉමහත් පිළිගැනීමක් ලබමින් එම නිෂ්පාදන වෙනුවෙන් ඉහළ වටිනාකමක් හිමිකර ගනිමින් ජාතික ආර්ථිකයට විදේශ විනිමය ඉපයීමෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි. මෙවන් මෙහෙවරක් ඉටු කිරීමට තේ හා රබර් වගා හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තීරණ ගැනීම හා අදාල කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා 2020 ඔක්තෝබර් මස 06 දිනැති අංක 2196/27 දරන ගැසට් පත්‍රයට අනුව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලදී. ඒ අනුව මෙම රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු එලඹුන ප්‍රථම වර්ෂය වූ 2021 වර්ෂයේදී වැවිලි භෝග අතරින් ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබාදෙන තේ හා රබර් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ආයතන කිහිපයක් ඔස්සේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම අමාත්‍යාංශය සඳහා 2021 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස වෙන් වූ රු. මි. 4,449.5 න් 90% ක පමණ මුල්‍ය ප්‍රගතියක් ළඟා කර ගනිමින් සමස්ථ තේ නිෂ්පාදනය 2020 වර්ෂයට සාපේක්ෂව 10% ක වර්ධනයක් ද රබර් හා තේ ආශ්‍රිත නිෂ්පාදන 15% ක වර්ධනයක් ද ළඟා කර ගැනීමට හැකිවිය.

රාජ්‍ය අමාත්‍යාංශයේ සුවිශේෂී ප්‍රමුඛතා වලට අනුගතව තේ වගාව ප්‍රවර්ධනය කිරීම, කාබනික පොහොර සුලභ කිරීම, ආයතනික හා මානව සම්පත් සංවර්ධනය, තේ වගාකරුවන්ගේ ධාරිතා සංවර්ධනය , යහපත් කෘෂිකාර්මික පුරුදු ප්‍රචලිත කිරීම, කාලගුණ විපර්යාසයන්ට මුහුණ දීම, තේ සමඟ මිශ්‍ර භෝග වගාව හා තේ කර්මාන්තශාලා නවීකරණය යන දිශානතීන් ඔස්සේ තේ වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් රාශියක් 2021 වර්ෂයේ දී ද දියත් කරන ලදී.

එසේම රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සුවිශේෂී ප්‍රමුඛතා ඔස්සේ දිශානතීන් හඳුනා ගනිමින් විවිධ වැඩසටහන් සිදු කරන ලදී. එනම් රබර් ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අතුරු භෝග වගාව, ප්‍රාදේශීය රබර් වෙන්දේසි ස්ථාපිත කිරීම, රබර් වගාව ප්‍රවර්ධනය, රබර් වගාවේ රෝග පාලනය, කුඩා රබර් හිමියන් දිරිගැන්වීම, රබර් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය, රබර් වගාකරුවන් කාබනික පොහොර භාවිතයට පෙළඹවීම, යහපත් කෘෂිකාර්මික පුරුදු ප්‍රචලිත කිරීම, රබර් පදනම් කරගත් අගය එකතු කළ නිෂ්පාදන සඳහා නව ව්‍යාපාර ආරම්භ කිරීමට කුඩා ව්‍යවසායකයන්ට සහාය වීම, කුඩා රබර් වතු හිමියන් සඳහා අමතර ආදායම් මාර්ග හඳුන්වා දීම යනාදිය ඒ යටතේ දී සඳහන් කළ හැකිවේ .

වැවිලි ක්ෂේත්‍රයට ආවේණික මෙන්ම විශේෂයෙන් තේ හා රබර් වගාවන් ආශ්‍රිතව මුහුණදෙන විවිධාකාර අභියෝග ජය ගනිමින් තේ හා රබර් ආශ්‍රිත භෝග වගාවන් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වීම සඳහා නූතන තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්ත අංශයක් ලෙස මෙම අංශය ප්‍රවර්ධනය කිරීම යන රජයේ ජාතික පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා වැවිලි අමාත්‍යාංශය සමඟ සමීප සබඳතාවක් සහිතව සමාගම් වතු ප්‍රතිසංස්කරණ තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සුවිශාල කාර්යභාරයක් ඉටු කරන ලද අතර, එම පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා වැවිලි ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වය හා සහභාගීත්වය බෙහෙවින් ඉවහල් කර ගනිමින් මෙම අමාත්‍යාංශය 2021 වර්ෂයේ දී අත්කරගත් කාර්යසාධනය පිළිබඳව සම්පිණ්ඩනයක් මෙම වාර්තාවෙන් ඉදිරිපත්කර ඇත.

දැක්ම

තේ, රබර් හා ආශ්‍රිත භෝග වගාවන් සහ නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුල ශක්තිමත් ජාතික ආර්ථිකයක් ස්ථාපිත කිරීම උදෙසා දායක වීමට ගෝලීය වෙළඳපොළ තුළ අඛණ්ඩ අලෙවි ප්‍රවර්ධනය තහවුරු කෙරෙන, අපනයන කේන්ද්‍රීය, නව තාක්ෂණය මඟින් වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාවලීන් සහ යහපත් කෘෂිකාර්මික හා කර්මාන්ත භාවිතයන් සමඟ වූ ප්‍රශස්ත ඵලදායිතාවයක් සහිත තේ, රබර් හා මිශ්‍ර භෝග වගාවන් හා ඒ ආශ්‍රිත විවිධාංගීකරණය වූ නිෂ්පාදන කර්මාන්ත අංශයක් බිහි කිරීම, සංවර්ධනය කිරීම හා තිරසාරව පවත්වාගෙන යාම.

අරමුණු (සුවිශේෂ ප්‍රමුඛතා)

1. සමාගම් වතු උපරිම ඵලදායීතාවයකින්, තේ හා වෙනත් අපනයන භෝග වගා ප්‍රවර්ධනය හා ඉහළ වටිනාකම් ඇති අපනයන නිෂ්පාදන බවට පත් කිරීම සහ අවශ්‍ය ජාත්‍යන්තර වෙළඳපොළ සකස් කිරීම.
2. කාබනික තේ වගාව දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම
3. දේශීය තේවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.
4. වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
5. තේ වතු ආශ්‍රිත වෙනත් භෝග හඳුන්වා දීම.
6. නවීන තාක්ෂණික ක්‍රමවේදයන් හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් තේ කර්මාන්තශාලා පූර්ණ නවීකරණයකට ලක් කිරීම හා අවශ්‍ය මූල්‍ය පහසුකම් සඳහා බැංකු ක්‍රමය සම්බන්ධ කිරීම.
7. ග්‍රාමීය මට්ටමේ තේ වගාව හා කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීම සඳහා සහන සේවා ක්‍රමවේදයන් බිම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
8. කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන්ගේ වගාව දියුණු කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දීම මඟින් රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සැපයීම සුලභ කිරීම.
9. දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මහපෙන්වීම මත 'නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්' ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත භෝග වගා හා තේ කර්මාන්තශාලා නවීකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජනය හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

1.4 සංවිධාන සටහන


ලේකම්
අතිරේක ලේකම්
අධ්‍යක්ෂ ජනරාල් (කෘෂිකර්ම)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ (PMMD)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
ප්‍රධාන ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක
සහකාර ලේකම්
සහකාර අධ්‍යක්ෂ (PMMD)
සහකාර අධ්‍යක්ෂ (PMMD)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 2
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
ගණකාධිකාරී තනතුරු 2
පරිපාලන නිලධාරී
සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී
වැවිලි අධීක්ෂණ නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී

1.4 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

01. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

01. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
03. සීමාසහිත කලුබෝවිටියාන තේ කර්මාන්තශාලාව
04. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
05. රබර් පර්යේෂණ ආයතනය
06. සීමාසහිත රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම	ව්‍යාපෘති කාල සීමාව
කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය	අන්තර්ජාතික කෘෂිකර්මය සඳහා වන අරමුදල	රු.මිලියන 7,966.827	2016 - 2023

02 පරිච්ඡේදය

වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා අනාගත දැක්ම.....

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ, පාරිසරික යන අංශයන්ගෙන් ඉතා වැදගත් කාර්යභාරයක් වැවිලි කර්මාන්ත අංශයෙන් ඉටු කරනු ලබයි. යටත් විජිතවාදින් විසින් සිය මව්රටට ආදායම් රැස්කරන මාධ්‍යයක් ලෙස වැවිලි ක්ෂේත්‍රය හඳුන්වා දෙන ලද නමුත් නිදහස ලබන අවධිය වන විට මනා වූ කළමනාකරණ සංවිධාන ව්‍යුහයක් තුළ ස්ථාපිතව පැවති වැවිලි අංශය එතැන් පටන් මේ දක්වා විවිධ පරිපාලනමය වෙනස්කම් හා නියාමනයන්ට යටත් වෙමින් වුවද, එහි මූලික ස්වරූපය පවත්වා ගනිමින් ක්‍රියාත්මක වෙමින් පවතී. වර්තමානය වන විට වැවිලි ක්ෂේත්‍රය මඟින් සමස්ථ අපනයන ආදායමට 24%කින් දායකත්වය සපයන අතර රටේ දළ දේශීය නිෂ්පාදනයට 2.5%ක පමණ දායකත්වයක් එක් කරනු ලබයි. එසේ වුවද, මෙම ක්ෂේත්‍රය තුළ ජීවනෝපාය කරගන්නා පිරිස රටේ සමස්ථ ජනගහණයෙන් 10%කට අධික ප්‍රමාණය සළකා බලන කළ වැවිලි ක්ෂේත්‍රයේ ආර්ථික සහ සමාජමය වැදගත්කම තවදුරටත් කැපී පෙනෙන සුළුය.

ජනතා කේන්ද්‍රීය ආර්ථික පිළිවෙත් මඟින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනැඟීම උදෙසා රජය විසින් ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ තුළ වැවිලි ක්ෂේත්‍රය සුවිශේෂී අංගයක් ලෙස හඳුනා ගනිමින් වැවිලි අංශයේ දායකත්වය දේශය ගොඩනැඟීමේ වැඩපිළිවෙල තුළ තහවුරු කරනු වස් "සමාගම් වතු ප්‍රතිසංස්කරණ තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා හා කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය" වෙත පැවරෙන වගකීම සුළුපටු නොවේ. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කෘෂි අපනයන භෝගය මත පදනම් වූ තේ කර්මාන්ත අංශයත්, රබර් කර්මාන්ත අංශයත් නඟා සිටුවීම ප්‍රධානතම ඉලක්කය කරගත් මෙම අමාත්‍යාංශය, තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා වාර්ෂික අයවැය මඟින් වෙන් කරනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදන, ප්‍රමුඛ හා ඵලදායී ක්‍රියාවන්හී ආයෝජනය කරමින් 2021 වර්ෂය තුළ වැඩසටහන්/ ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවා සාර්ථක ප්‍රතිඵල ළඟාකර ගැනීමට හැකිවිය.

2021 වර්ෂයේදී ද තේ වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සුවිශේෂී ප්‍රමුඛතා ගණනාවක් ඔස්සේ විවිධ වැඩසටහන්/ ව්‍යාපෘති රාශියක් මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදී. තේ වගාව සංවර්ධනය, කුඩා තේ වතු අංශයේ වගා සංවර්ධනය සඳහා සහන සේවා ක්‍රියාත්මක කිරීම, කාබනික තේ වගාව දිරිමත් කිරීම, දේශීය තේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම, තේ කර්මාන්තශාලා නවීකරණය, කුඩා තේ වතු අංශයේ ආයතනික හා මානව සම්පත් සංවර්ධනය, තේ වගාකරුවන්ගේ නිපුණතා සංවර්ධනය හා තේ වගා භූමිවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා අතුරු භෝග නිෂ්පාදනය මෙම සුවිශේෂී ප්‍රමුඛතා වේ.

2021 වර්ෂයේදී තේ නිෂ්පාදනයට ප්‍රශස්ථ කාලගුණික තත්ත්වයක් පැවතුන අතර 2015 වර්ෂයේ සිට මේ වන තෙක් සංශෝධනය කර නොතිබූ තේ වගා සහනාධාරය 2021 වර්ෂයේ සිට නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු.500,000 සිට රු.630,000 දක්වාත් තේ නව වගා සහනාධාරය

හෙක්ටයාරයට රු.400,000 සිට රු. 500,000 දක්වාත් වැඩි කිරීම ද, වසරක් තුළ අක්කර 5,000 ඉක්මවා නව තේ වගා බිම් ප්‍රමාණයක් තේ වගාවට එක් කර ගැනීමට බෙහෙවින් ඉවහල් විය. ඒ අනුව වර්ෂ අවසානය වන විට තේ නිෂ්පාදනය කි.ග්‍රෑම්. මිලියන 299 ක් දක්වා ඉහළ නැංවීමට හැකි වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 7%ක වර්ධනයක් පෙන්නුම් කරයි. එමෙන්ම නිමි තේ අපනයනයෙන් රු.බිලියන 263ක ආදායමක් ඉපයීමට හැකි වූ අතර එය පසුගිය වසර හා සැසඳීමේදී 13%ක වර්ධනයකි.

විස්තරය	වර්ෂ 2019	වර්ෂ 2020	වර්ෂ 2021	වර්ෂ 2022 ඉලක්කය
තේ නිෂ්පාදනය (මෙ.ටො)	300,120	278,489	299,488	325,000
අපනයන ආදායම (රු.මිලි.)	240,637	230,170	263,353	302,000
අපනයන ප්‍රමාණය (මෙ.ටො)	272,657	265,569	285,872	309,000

මෙම අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන වැවිලි භෝගයක් ලෙස රබර් වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ද සුවිශේෂී ප්‍රමුඛතා ගණනාවක් ඔස්සේ විවිධ වැඩසටහන් / ව්‍යාපෘති රාශියක් 2021 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදී. රබර් වගාව සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු අංශයේ සංවර්ධනය සඳහා දිරිගැන්වීම් ක්‍රියාත්මක කිරීම, වෙළෙඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරි ගැන්වීම, රබර් සැකසුම් මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, රබර් වගා ක්ෂේත්‍රයේ ආයතනික සහ මානව සම්පත් සංවර්ධනය, රබර් වගාකරුවන්ගේ නිපුණතා සංවර්ධනය, රබර් වතු ආශ්‍රිත ඵලදායිතාව ප්‍රවර්ධනය උදෙසා අතුරු භෝග නිෂ්පාදනය හා රබර් වගා ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම සුවිශේෂී ප්‍රමුඛතා වේ.

ජාතික ආර්ථිකයට රබර් ක්ෂේත්‍රයේ දායකත්වය විමසීමේදී රබර් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රය මඟින් ඉතිහාසයේ ප්‍රථම වරට රු.බිලියන 217.351ක ආදායමක් ලබා ගත හැකි වූ අතර එය පසුගිය වසර හා සැසඳීමේදී 43%ක වර්ධනයකි. එසේම ස්වභාවික රබර් නිෂ්පාදනය 2021 වර්ෂයේදී මෙ.ටො.76,884 ක අගයක් දරන අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී වර්ෂයේ තෙවෙනි කාර්තුව දක්වා සාපේක්ෂව ඉහළ අගයක් පැවතිය ද සමස්ථ වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණය 2020 වර්ෂයට වඩා සුළු පසුබෑමක් පෙන්නුම් කරයි. වර්ෂයේ අවසන් කාර්තුවේදී පැවති අධික වර්ෂාපතනය මෙම පසුබෑමට හේතු විය.

විස්තරය		වර්ෂ 2019	වර්ෂ 2020	වර්ෂ 2021	වර්ෂ 2022 ඉලක්කය
රබර් නිෂ්පාදනය (මෙ.ටො)		74,752	78,205	76,884	83,000
අපනයන ආදායම (රු.මී.)		159,174	151,080	217,352	240,000
අපනයන ප්‍රමාණය	**මෙ.ටො**	94,799	87,738	84,623	අමු රබර් (4001) - මෙ.ටො.17,800
					අර්ධ නිම් රබර් (4003 - 4006) - මෙ.ටො. 5050
	ඒකක	31,850,853	30,193,777	48,715,574	නිම් භාණ්ඩ (4007 - 4017) - මෙ.ටො. 72,000
					නිම් භාණ්ඩ (4007 - 4017 ඒකක) - 36,000,000

2021 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය වෙත අයවැය ප්‍රතිපාදන ලෙස පුනරාවර්තන වියදම් සඳහා රු.මි. 1,074.17ක් ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු.මි. 4450.03ක් ද, ප්‍රතිපාදන වෙන් වී තිබුණි. 2021 වර්ෂයේදී ද රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා අවම කාර්ය මණ්ඩලයක් යටතේ වුව ද අතිරේක ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මි. 983.5ක් ලබා ගනිමින් පුනරාවර්ථන වියදම් සඳහා වූ ප්‍රතිපාදන 93.05% ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවලින් 2021.08.28 දින මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද "රාජ්‍ය වියදම් සමාලෝචනය" යන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව රු.මි. 289.83ක් ඉතිරි කිරිමට කටයුතු කොට 75.62% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. ඒ අනුව අමාත්‍යාංශයේ සමස්ථ මූල්‍ය ප්‍රගතිය 83% දක්වා ඉහළ අගයක් ගන්නා ලදී.

2021 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ලැබුනු ප්‍රතිපාදන වලට අමතරව රු.මි.50ක ප්‍රතිපාදන අඩු ආදායම්ලාභී තේ වගාකරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ද, රු.මි.50ක ප්‍රතිපාදන ටයර් පරීක්ෂා කිරීම සහ මූලාකෘතිකරණය සඳහා අංගසම්පූර්ණ පර්යේෂණ පහසුකම් ස්ථාපිත කිරීම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය මඟින් ද ලබා දෙන ලදී. ඉහත සඳහන් ප්‍රතිපාදන භාවිතා කොට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු සාරාංශගතව පහත වගුවෙන් දක්වා ඇත.

අමාත්‍යාංශය වෙත ලැබුණු ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය (2021.12.31 දිනට)

අනු අංකය	ව්‍යාපෘතිය	ක්‍රියාත්මක කරන ලද ආයතනය	2021 වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මී.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
01.	කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය	කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය	1,600	1,141.93	**තේ ක්ෂේත්‍රය** • තේ නැවත වගාව ඉලක්කය වන හෙක්ටයාර 4,500න් හෙක්ටයාර 1,919.12 ක් සම්පූර්ණ කර ඇත. • කුඩා තේ සංවර්ධන සමිති සඳහා ව්‍යාපෘති සැලසුම් 05ක්, ධාරිතා සංවර්ධන සැලසුම් 20ක් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් 07ක් සකස් කරන ලදි. • කුඩා තේ සංවර්ධන සමිති 206ක් සඳහා තේ නැවත වගාවට අදාළ උපකරණ 730ක් ලබා දී ඇත. • Co3 තෘණ වගාව සහ පාංශු පරීක්ෂණ ක්‍රමවේද යටතේ තේ නව වගාව හෙක්ටයාර 522.83ක් සඳහා බලපත්‍ර නිකුත් කොට ඇත. • පාංශු පරීක්ෂණ යටතේ තේ නැවත වගාව හෙක්ටයාර 34.6ක් නිම කර ඇත. • මානා සිටුවීමේ ක්‍රමවේදය යටතේ තේ නැවත වගාව හෙක්ටයාර 751.64ක් නිම කර ඇත. • Co3 තෘණ වගා ක්‍රමවේදය යටතේ හෙක්ටයාර 673.85ක පාංශු පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර ඇත. • තේ තවාන් සහ අතුරු භෝග වගාව සඳහා ප්‍රතිලාභීන් 1,878ක් සඳහා සහනාධාර ලබා දී ඇත. • රු.මිලියන 25.8ක වියදමින් කුඩා තේ වතු හිමියන් සඳහා ආර්ථික මධ්‍යස්ථාන 15ක් ඉදිකොට අවසන් කර ඇත.

					• තේ තවාන් 300ක් සඳහා තවාන් නෙට්, මෙතම්සෝඩියම් වැනි යෙදවුම් ලබා දී ඇත. **රබර් ක්ෂේත්‍රය** • තුරුසවිය සමිති 15ක් සඳහා කළමනාකරණ සහ ව්‍යාපාර ධාරිතා සංවර්ධනය සිදු කර ඇත. • තුරුසවිය සමිති 87 ක් සඳහා රබර් නව වගාවට අදාළ උපකරණ 341 ක් ලබා දී ඇත. • රබර් නව වගා ඉලක්කය වන හෙක්ටයාර 3,000 මේ වන විට වගා කර අවසන් කර ඇත. • රබර් තවාන් සහ අතුරු භෝග වගාව සඳහා ප්‍රතිලාභීන් 2,600කට ගැලපුම් දීමනා ගෙවා අවසන් කර ඇත. • ග්‍රාමීය මූල්‍යකරණ ක්‍රමවේදය යටතේ තේ හා රබර් ක්ෂේත්‍රයේ ගොවීන් 925ක් සඳහා ණය ලබාදීම සිදු කොට ඇත.
02.	ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වතු ඉඩම් වල කැඩස්තර මිනුම් කටයුතු සිදුකර කඩයිම් සිතියම් සකස් කිරීම	වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය	130	38.5	• මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් වතු 16 ක් මැනීම කටයුතු සිදුකර ඇත. (කණු සිටුවීමේ කාර්යය අදාල වැවිලි සමාගම් මඟින් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කොට ඇති බැවින් ඉතිරි ප්‍රතිපාදන වියදම් දැරීමට නොහැකි විය.)
03.	රබර් මහසැලැස්ම ක්‍රියාත්මක කිරීම	රබර් මහ ලේකම් කාර්යාලය	20	12.10	• රබර් ආශ්‍රිත කුඩා කර්මාන්ත ඇති කිරීමට 22 දෙනෙකු සඳහා අවශ්‍ය පුහුණුව හා ප්‍රතිලාභීන්ට අවශ්‍ය අව්වු ලබා දීම. • සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමේ තෝරා ගත් වතුයායන්වල වැඟි ආවරණ යෙදීම, අතුරු භෝග වගා කිරීම. (කොවිඩ් වසංගතය හේතුවෙන් රබර් වෙන්දේසිය ආරම්භ කිරීමට නොහැකිවීම හා මහ ලේකම් කාර්යාලය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පරිශ්‍රය වෙත රැගෙන යාම හේතුවෙන් ඉතිරි ප්‍රතිපාදන වියදම් දැරීමට නොහැකි විය.)
04.	නව තාක්ෂණයෙන් යුතු එක් දින වියළුම් කුටීර කුඩා රබර් ඉඩම් හිමියන්ට ලබාදීම.	තුරුසවිය අරමුදල	21	21	• නව තාක්ෂණයෙන් යුතු එක් දින වියළුම් කුටීර 135 ක් වැඩ අවසන් කර ප්‍රතිලාභීන්ට ලබා දී ඇත. (100%)

05.	තිරසාර රබර් ශාකයේ ලක්ෂණ, පසේ ලක්ෂණ හා ක්ෂේත්‍රයේ ලක්ෂණ උපයෝගී කර ගනිමින් පවතින පොහොර නිර්දේශ යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය (2017 - 2021)	රබර් පර්යේෂණ ආයතනය	1	1	• පර්යේෂණ දත්ත පරිගණක ගත කොට පෝෂක අන්තර් සම්බන්ධතා නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව අපරිණත රබර් වගාව සඳහා නයිට්‍රජන් පෝෂකයේ ඌණතාවයක් සියලුම රබර් වගා කරන ප්‍රදේශ සඳහා ද මැග්නීසියම් සහ පොටෑසියම් පෝෂකයන්ගේ ඌණතාවයක් හඳුනාගත් සමහර ප්‍රදේශ සඳහා, පරිණත වගාවේ මැග්නීසියම් පෝෂකයේ ඌණතාවයක් ඇති බවද හඳුනාගන්නා ලදී. ඒ අනුව ඉදිරියේදී පොහොර නිර්දේශයන් යාවත්කාලීන කිරීමට බලාපොරොත්තු වනු ඇත. • කාබනික පොහොර සම්බන්ධ අත් පොත නිර්මාණය කර ඉදිරිපත් කරන ලදී. • කුඩා ඉඩම් හිමියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
06.	ලෝක වෙළඳපොළේ පවතින තරහකාරීත්වයට ගැළපෙන ලෙස දේශීයව පවතින තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඩාර්ටන්ෆීල්ඩ් වතුයාය ආදර්ශ රබර් වගාවක් ලෙස අනුවර්තනය කිරීම (2017 - 2021)	රබර් පර්යේෂණ ආයතනය	16	16	• ඩාර්ටන්ෆීල්ඩ් වතුයායේ ඉඩම් හෙක්ටයාර 64ක නැවත රබර් වගා කිරීම හා අතුරු භෝග ලෙස කෙසෙල් හා කුරුඳු වගා කර ඇත. රබර් වගා කළ නොහැකි ඉඩම් හෙක්ටයාර 6ක පමණ කුරුඳු (උදා:- විදුලි බල මාර්ග යට) හා තවත් හෙක්. එකක පමණ තැඹිලි වගා කර ඇත. එසේම වතු යාය තුළ අභ්‍යන්තර මාර්ග පද්ධති නවීකරණය කරන ලදී. නැවත රබර් වගා කිරීම සඳහා සම්පූර්ණයෙන් සකස් කරන ලද ඉඩම් හෙක්ටයාර 12ක් පමණ අප්‍රේල් මාසයේ වගා කිරීමට නියමිතව ඇත.
07.	රබර් කර්මාන්තය සඳහා පරීක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතීතිත විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම (2021 - 2022)	රබර් පර්යේෂණ ආයතනය	22	22	• ISO 17025 තත්ත්ව සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කරන ගුණාත්මක ප්‍රතිපත්ති අත්පොත (Quality Policy Manual), ක්‍රියා පටිපාටි අත්පොත (Procudure Manual) පිළියෙළ කොට අවසන් කර ඇත. • අන්තර්ජාතිකව පිළිගත් නවතම විශ්ලේෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම, දැනට පවතින ක්‍රමවේද යාවත්කාලීන කිරීම හා එම විශ්ලේෂණ ක්‍රමවේද නිසි ලෙස විද්‍යාගාරය තුළ ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ තහවුරු කර ගැනීමේ (Method Validation) ක්‍රියාමාර්ගය ස්ථාපනය කර ඇත. • ISO 17025 තත්ත්ව සහතිකය ලබා ගැනීමට විද්‍යාගාරය තුළ පවත්වා ගත

					යුතු ක්‍රියා පිළිවෙල පිළිබඳව විද්‍යාගාර කාර්යමණ්ඩලය පුහුණු කර ඇත. • විද්‍යාගාරය මඟින් ලබා ගත් ප්‍රතිඵල ISO 17025 ප්‍රතීතිත තත්ත්ව සහතිකය සහිත විද්‍යාගාර දෙකක් සමඟ (මැලේසියානු රබර් පර්යේෂණායතනය හා Dipped Products පෞද්ගලික ආයතනය සමඟ) සංසන්දනය කොට ප්‍රතිඵල තහවුරු කර ඇත. • ඉතා නිවැරදි විශ්ලේෂණ ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය කරන විද්‍යාගාර උපකරණ (Mooney Viscometer, pH Meter) හා රසායන ද්‍රව්‍ය මිලදී ගෙන ඇත. • අන්තර්ජාතික තත්ත්ව සහතික ලබා ගැනීමට විද්‍යාගාරය තුළ පවත්වා ගත යුතු පාරිසරික තත්ත්ව හා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද ස්ථාපනය කිරීමට අවශ්‍ය කරන Fume Hoods, Laboratory Furniture, Humidity Meters, Thermo Meters මිල දී ගෙන ඇත.
08.	පරිසර හිතකාමී ආර්ථිකමය සහනදායී සෙමෙන් පොහොර මුදාහරින තාක්ෂණය ක්ෂේත්‍ර ස්ථාපනය මඟින් රබර් වගාවේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම හා රබර් කර්මාන්තය උදෙසා වූ විශ්ලේෂණ කර්මාන්තය වැඩි දියුණු කිරීම පිණිස රසායනාගාර පහසුකම් ජාත්‍යන්තර තත්ත්වයට පත්කිරීම (2021 - 2023)	රබර් පර්යේෂණ ආයතනය	25	25	• වැඩි දියුණු කරන ලද කොහුබත් පොහොර කැට වතු සමාගම් සහ කුඩා රබර් වගා හිමියන්ගේ හෙක්ටයාර 12ක් පමණ වූ භූමි ප්‍රමාණයක ස්ථාපනය කරන ලදී. (අයර්, එල්ස්ටන්, හල්පේ, පාරඬේ, පෙන්රිත්, ක්ලයිඩ්, දේවාලකන්ද හා සාලාව යන වතු සමාගම් සහ කුඩා රබර් වගාවන් 6ක) • වැඩි දියුණු කරන ලද නැවත භාවිතා කළ හැකි සිදුරු සහිත පොහොර නළ වතු සමාගම් 12ක හෙක්ටයාර 50ක් වූ භූමි ප්‍රමාණයක ස්ථාපනය කරන ලදී. (අයර්, එල්ස්ටන්, පෙන්රිත් , සාලාව, පුස්සැල්ල, හල්පේ, ක්ලයිඩ්, ක්ලෝඩන්, පාරඬේ, දේවාලකන්ද, වී ඔය, පනාවත්ත) • සිදුරු සහිත පොහොර නළය පිරවීම සඳහා නව යන්ත්‍රයක් හඳුන්වා දෙන ලදී. • පුහුණු වැඩසටහන් 09ක් මෙහෙයවන ලදී. • විද්‍යාගාරයේ තත්ත්ව පරිපාලනය සම්බන්ධව මූලික දැනුවත් වීමේ වැඩසටහනක් පවත්වන ලදී.

09.	ආන්තික ප්‍රදේශවල තිරසාර රබර් වගාවක් සඳහා වියළි තත්ව වලට ඔරොත්තු දෙන ක්ලෝන පරීක්ෂා කිරීම (2021 - 2024)	රබර් පර්යේෂණ ආයතනය	20.5	20.5	• මේ යටතේ විදේශීය රටවල්වලින් ලබාගත් ක්ලෝන, ගුණනයකර දේශීය තත්ත්වයන්ට සුදුසුබව පරීක්ෂා කිරීම ආරම්භ කර ඇත. තවද අතුරු ක්ලෝන නිර්දේශය සඳහා තෝරාගත් ක්ලෝන, බද්ද අතු තවාන්වල ස්ථාපිත කිරීම සහ වියළි කාලගුණ තත්ත්වවලට ඔරොත්තු දෙන ක්ලෝන කඩිනමින් හඳුනා ගැනීමට අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය කර ඇත. එමෙන්ම අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ සඳහා ප්‍රශස්ත මූලික තත්ත්ව සැකසීම අවසන්කර ඇත.
10.	නව පත්‍ර පතන රෝගයට අදාළ වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන් ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම (2021 - 2025)	රබර් පර්යේෂණ ආයතනය	10	10	• පත්‍ර රෝගී සාම්පල 140ක් අධ්‍යයනය කොට රෝගය සෑදීමට දායක වන ව්‍යාධිජනකයා වෙන් කර ගන්නා ලදි. • රෝගය මර්දනය කිරීම සඳහා බෙහෙත් ඉසීමේ පර්යේෂණ 13ක් සිදු කර ඇත. • මෙම රෝගය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කර ඇත. (04)
11.	ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්ත ශාලාවල අපසන්දන ජලය පිරිපහදු කිරීමේ ඒකක අධීක්ෂණය කිරීම හා ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම (2021 - 2022)	රබර් පර්යේෂණ ආයතනය	28	28	• මේ සඳහා අදාළ විද්‍යාගාරය අන්තර්ජාතික පිළිගත් සහතික ලබාදිය හැකි ප්‍රතීතනය කළ විද්‍යාගාරයක් ලෙස උසස් කිරීමට අවශ්‍ය අළුත්වැඩියා කටයුතු ආරම්භ කොට ඇත. ඊට අමතරව රබර් ෂීට් නිපදවන සුළු රබර් ඉඩම් හිමියන් සඳහා ගැළපෙන තාක්ෂණයෙන් යුතු අපසන්දන ජලය පිරිපහදු කිරීම සඳහා වූ ක්ෂේත්‍ර මට්ටමේ පර්යේෂණ ආරම්භ කොට ඇත.
12.	කුඩා රබර් වතු වල ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම දිරිගැන්වීම තුළින් එම ඉඩම් ලාභදායී වාණිජ ඒකක බවට පත් කිරීම	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව	40	36.90	• ආදර්ශ රබර් වගා 64ක් ස්ථාපිතකර ඇත. • රබර් වගාවේ මායිම් වැට ආශ්‍රිතව හෙක්ටයාර 150ක පුවක් වගාව සිදු කර ඇත. • රබර් වගාව සමඟ ඇන්තූරියම් වගා ඒකක 14ක් සිදු කර ඇත. • රබර් ආශ්‍රිත කුකුල් පාලන ඒකක 34 ක් සිදු කර ඇත.

					• රබර් වගාව ආශ්‍රිතව මී මැසි පාලනය - 10.00 ඒකක 64 ක් සිදු කර ඇත. • රබර් මිශ්‍ර තේ වගා හෙක්ටයාර 3 ක් සිදු කර ඇත. • රබර් සමඟ අන්නාසි වගාව හෙක්ටයාර 12 ක් සිදු කර ඇත. • රබර් වගාව ආශ්‍රිත බිම්මල් වගාව ඒකක 15 ක් සිදුකර ඇත. (ව්‍යාපෘතිය අනුමත කර ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් වැය වූ බැවින් සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා වියදම් දැරීමට නොහැකි විය)
13.	දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට ස්වභාවික රබර් ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීම සඳහා සහනාධාර ලබා දීම	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව	20	16.67	• කි.ග්‍රෑම් 200 ප්‍රමාණයේ සමූහ සැකසුම් මධ්‍යස්ථාන 8 ක් ඉදි කර ඇත. • කි.ග්‍රෑම් 50 ප්‍රමාණයේ සමූහ සැකසුම් මධ්‍යස්ථාන 19 ක් ඉදි කර ඇත. • පරිණත වගාවේ කිරිකෝප්ප රඳවන යෙදවීම සිදුකොට ඇත. • ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදන සඳහා අවශ්‍ය පෙණ පතුරු හා කිරි පෙරන නිපදවා ඇත. • වැහි ආවරණ යෙදීම සඳහා ගම් මිශ්‍රණය (සීලන්ට්) නිපදවීමේ කර්මාන්ත දියුණු කිරීම සිදුකොට ඇත. (ව්‍යාපෘතිය අනුමත කර ගැනීම සඳහා සැලකියයුතු කාලයක් වැය වූ බැවින් සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා වියදම් දැරීමට නොහැකි විය)
14.	කාළගුණික විපර්යාස අවම කිරීම සඳහා තේ වතුවල උස් හා මධ්‍ය සෙවණ ශාක ව්‍යාප්ත කිරීම	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	30	20	• දිස්ත්‍රික්ක අනුව සෙවණ ශාක නිෂ්පාදනය කරන ලද ප්‍රමාණයන් ➢ උඹව දිස්ත්‍රික්කය - ග්‍රැවිලියා ශාක 52,500 ➢ මාතර දිස්ත්‍රික්කය - ඇල්බීසියා ශාක 1,75,000 ➢ නුවරඑළිය දිස්ත්‍රික්කය - ග්‍රැවිලියා ශාක 25,000 ➢ ගාල්ල දිස්ත්‍රික්කය - ඇල්බීසියා ශාක 1,70,000 ➢ කළුතර දිස්ත්‍රික්කය - ඇල්බීසියා ශාක 18,500 ➢ කෑගල්ල දිස්ත්‍රික්කය - ඇල්බීසියා ශාක 25,000 ➢ රත්නපුර දිස්ත්‍රික්කය - ඇල්බීසියා ශාක 60,138 ➢ නුවර දිස්ත්‍රික්කය - ග්‍රැවිලියා ශාක 30,000

					• මෙම පැළ ගොවීන් වෙත බෙදා දෙමින් පවතී. (බීජ සපයා ගැනීමේ ගැටළු පැවතීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා වියදම් දැරීමට නොහැකි විය.)
15.	යාන්ත්‍රීකරණය සඳහා තරුණ ව්‍යාසායකයින් පුහුණු කිරීම හා උපකරණ කට්ටල ලබාදීම	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	45.5	45.5	• වලවල් හාරන යන්ත්‍ර 84ක් ලබා දී ඇත. මුළු කප්පාදු යන්ත්‍ර 126ක් ලබා දී ඇත. • ස්ප්‍රේ යන්ත්‍ර 210ක් ලබා දී ඇත. හිස්වැසුම්, සපත්තු, අත්වැසුම්, ඇස් ආවරණ සහ සමස්ථ කට්ටල 420ක් යාන්ත්‍රීකරණ කණ්ඩායම් වලට ලබා දී ඇත. • පුහුණු වැඩසටහන් අවසන්කර ඇත. (කෑගල්ල - වැඩසටහන් 2, ගාල්ල - වැඩසටහන් 2, මාතර - වැඩසටහන් 2, ඌව - වැඩසටහන් 1, රත්නපුර - වැඩසටහන් 2, නුවරඑළිය - වැඩසටහන් 1, කළුතර - වැඩසටහන් 1, නුවර - වැඩසටහන් 2) • ව්‍යවසායකයන් 316ක් පුහුණුකර ඇත.
16.	කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගාල්ල හා කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයන්හි සේවා සැපයීම එක් පරිශ්‍රයක් වෙත ගෙන ඒම	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	70	49	• දෙහිඕවිට හා වලහන්දුව ප්‍රාදේශීය කාර්යාල නවීකරණය සිදු කොට ඇත. ඉතිරි වී ඇති කොටස් 2022 වර්ෂයේ ප්‍රතිපාදන භාවිතා කොට නිම කිරීමට බලාපොරොත්තු වේ. (ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් රු.මි.49ක් පමණක් අනුමත කළ බැවින් ඉතිරි ප්‍රතිපාදන වියදම් කිරීමට නොහැකි විය)
17.	තේ වගාව සඳහා ජල සම්පාදන ක්‍රම ක්‍රියාත්මක කිරීම	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	600	0.00	• මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ප්‍රමාද වී ලැබුණු අතර එම කාල වකවානුවේදී වර්ෂාව වැඩි වශයෙන් ලැබුණි. එබැවින් ප්‍රතිලාභීන්ගේ උනන්දුව අඩුවීම හා ආනයන සීමාකම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි විය.
18.	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව නව තාක්ෂණයට අනුවර්තනය කිරීම	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව	24.5	18.5	• කළුබෝවිටියාන, දෑරංගල, හිනිදුම, මැණික්දිවෙල යන තේ කර්මාන්තශාලා සඳහා පහත සඳහන් උපකරණ ලබා ගෙන ඇත. ➢ Conveyor System ➢ 02 No Fibro Mat and 01 No Michi Sifter ➢ Technical Machineries for extracting fiber (ආනයන සීමාකම් හේතුවෙන්

					විදේශීයව ගෙන්වීමට බලාපොරොත්තු වූ උපකරණ ලබාගැනීමට නොහැකිවීම මත මුළු ප්‍රතිපාදන වැය කිරීමට නොහැකි විය.)
19.	ටයර් කර්මාන්තයට අවශ්‍ය පරීක්ෂණ සහ පර්යේෂණ පහසුකම් සැපයීමේ පරමාර්ථයෙන් ටයර් පරීක්ෂා කිරීම සඳහා විශ්ලේෂණ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම	රබර් පර්යේෂණ ආයතනය	50	50	• රබර් ටයර් නිෂ්පාදකයින්ගේ ප්‍රමුඛතාව මත හඳුනාගත් මිලියන 40ක පමණ උපකරණ මේ වන විට ඇණවුම් කර ඇත. එම උපකරණ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව සහ ශ්‍රී ලංකා රබර් කර්මාන්තකරුවන්ට පොදුවේ භාවිත කළ හැකි සහ ආදර්ශමත් තාක්ෂණික ඒකකයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා රත්මලාන රබර් තාක්ෂණ අංශයේ වර්ග අඩි 1600ක දිගුවක් සැලසුම් කොට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.
20.	සමෘද්ධි/ අඩු ආදායම්ලාභී පවුල් 200,000 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන (තේ වගාකරුවන්ගේ ආර්ථික ශක්තිය ඉහළ නැංවීම)	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	50	50	• ප්‍රතිලාභීන් 690කට කුකුළු පැටවු බෙදා දීම සිදු කොට ඇත. • ප්‍රතිලාභීන් 592 කට මී මැසි ජනපද සහ මී මැසි පෙට්ටි ලබා දී ඇත. • කළු ගම්මිරිස්, කුරුඳු, පුවක්, කරාබු නැටි වැනි සුළු අපනයන භෝග ප්‍රතිලාභීන් 592 කට බෙදා දී ඇත.

මෙම අමාත්‍යාංශය මඟින් සෘජුවම ප්‍රතිපාදන ලද ඉහතින් දැක්වූ ව්‍යාපෘතිවලට අමතරව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තේ නැවත වගාව, නව වගාව, පාළු පැළ සිටුවීම, ගුණාත්මක තේ පැළ සුලබ කිරීම, ඩොලමයිට්, සින්ක් සල්ෆේට් ලබාදීම වැනි සහනාධාර හා ව්‍යාප්ති සේවා සැපයීම සඳහා රු.මි. 1,400ක් ප්‍රාග්ධන ලෙස වෙන් වූ අතර ඉන් රු.මි. 1,369ක් වියදම් කොට 99% ක භෞතික ප්‍රගතියක් ලබාගෙන ඇත.

රබර් නැවත වගාව, නව වගාව, අතුරු භෝග වගාව, වැහි ආවරණ යෙදීම, රබර් වතුවල ඵලදායීතාවය ඉහළ නැංවීම, දුම් ගෙවල් ඉදිකිරීම, ගොවිපොළ ඒකක ඇති කිරීම, රබර් වගා ආශ්‍රිත උපකරණ ලබාදීම, පුහුණු වැඩසටහන් සහ රබර් පැළ නිෂ්පාදනය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් රු.මි. 927 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් වූ අතර එයින් රු.මි. 916.16ක වියදමක් දරමින් 99% ක භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට එම දෙපාර්තමේන්තුව සමත් විය.

හරිත ආර්ථිකයක් වෙනුවෙන් නැගෙනහිර හා ඌව පළාත්වල රබර් වගාවේ පාරිසරික වැදගත්කම කාබන් වෙළඳපොළ දක්වා ගෙන යෑම, රබර් වගාවේ සුදු මුල් රෝගය පාලනය සඳහා උපාය මාර්ග වැඩි දියුණු කිරීම, රබර් වගාව යටතේ ඖෂධීය, පලතුරු භෝග හා බහුකාර්ය භෝග වගා කිරීම, අඩු තීව්‍රතාවයෙන් කිරි කැපීමේ ක්‍රම ඉදිරිපත් කිරීම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනය වෙත ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.මි. 135ක් වෙන් වූ අතර ඉන් රු.මි. 130ක් වියදම් කොට 98% ක භෞතික ප්‍රගතියක් අත් කර ගන්නා ලදි.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් උපාධි පිරිනමන ආයතනයක් දක්වා ආයතනයේ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම, වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ සේවා නියුක්තිකයන්, කුඩා තේ වතු හිමියන් සඳහා හා පාසැල් හැර ගිය සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා (NVQ) පැවැත්වීම 2021 වර්ෂයේදී ද සිදු කර 100%ක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

<u>අමාත්‍යාංශයේ අංශ අනුව 2021 වර්ෂයේ කාර්යසාධනය</u>

සැලසුම් අංශය

2020 ඔක්තෝම්බර් මස නව අමාත්‍යාංශයක් ලෙස වැඩ කටයුතු ආරම්භ කරමින් 2021 වර්ෂයේදී ද සැලසුම් අංශය විසින් තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධන සඳහා වූ විශේෂ ව්‍යාපෘති සම්බන්ධීකරණය සිදු කරමින් සැලසුම්සහගත ඉදිරි දැක්මකින් යුතුව කටයුතු කරන ලදි. අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ආයතන සම්බන්ධ කරමින් ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම මෙන්ම තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති යෝජනා 27ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකරමින් 2021 වර්ෂය සඳහා සූදානම් වීම ප්‍රථමයෙන් සිදු කරන ලදී . එසේම අයවැය කතාව මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන සඳහා මුදල් අමාත්‍යාංශයේ ආකෘතිපත්‍ර අනුව සකස් කරන ලද විශේෂ ව්‍යාපෘති 8කට අදාළ යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකොට අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් වූ ප්‍රතිපාදන මත මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ආකෘතිපත්‍ර අනුව සකස් කිරීමට උපදෙස් ලබා දෙමින් අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල 2021ට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට මුදල් අමාත්‍යාංශය, විගණකාධිපති කාර්යාලය වැනි ආයතන වෙත යොමු කරන ලදි.

අමාත්‍යාංශය හා ඒ යටතට අයත් ආයතනවලට අදාළ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා මාසිකව හා කාර්තුමය වශයෙන් රැස්වීම් 12ක් නියමිත කාලවකවානු තුළ ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඇති අතර ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශය සහ දැනුම් දෙනු ලබන අනෙකුත් සියළුම ආයතන සඳහා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය

ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය ඇතුළු විවිධ ආකෘති මඟින් ඉල්ලනු ලබන වාර්තා 30කට අධික සංඛ්‍යාවක් අදාළ ආයතන වෙත යොමු කරන ලදි. 2022 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කළ යුතු වූ අමාත්‍යාංශයේ 2021 ප්‍රගති වාර්තාව සකස් කිරීම ද සැලසුම් අංශයේ මූලික වගකීමක් වන අතර එය නියමිත දිනට පූර්වයෙන් සකස් කර ඉදිරිපත් කරන ලදී. අමාත්‍යාංශයේ 2020 වර්ෂ අවසාන කාර්යසාධන වාර්තාව සකස් කිරීම සහ නිසි වේලාවට පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම ද සැලසුම් අංශය විසින් සිදු කළ තවත් එක් විශේෂ කාර්යයකි.

අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමින් ග්‍රාමීය ආර්ථිකය නහා සිටුවීමේ ජාතික වැඩසටහන, ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය විසින් සමන්ධීකරණය කරනු ලබන ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන, ගම සමඟ පිළිසඳරක්, වැඩ සමඟ යළි ගමට වැනි වැඩසටහන්වලට අදාලව රැස්වීම් වලට සහභාගි වීම, තොරතුරු යොමු කිරීම, අදාල තීරණ ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීම හා ප්‍රගතිය යොමු කිරීමේ කටයුතු 2021 වර්ෂයේදී ද සැලසුම් අංශය විසින් සිදු කරන ලදි. මෙකී කාර්යයන්වලට අමතරව අමාත්‍යාංශයට සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතීන්ට අදාළ ප්‍රතිපාදන නිදහස් කිරීම, මහබැංකුව වෙත දත්ත හා වාර්තා සැපයීම, විවිධ පාර්ශව වෙතින් ඉල්ලීම් සිදු කරනු ලබන වාර්තා සකස්කොට යොමු කිරීම 2021 වර්ෂයේදී ද සිදු කරනලද සුවිශේෂී කාර්යභාරයන් ලෙස දැක්විය හැකිය.

පාලන අංශය

අමාත්‍යාංශයට අයත් පාලන අංශය මඟින් අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලයේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, වාර්ෂික කාර්යසාධන ඇගයුම් සම්බන්ධ කටයුතු, ආයතනික කටයුතු, විනය කාර්යයන් පවත්වාගෙන යාම, තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම් සිදු කිරීම මෙන්ම අමාත්‍යාංශයට අයත් ආයතනවල පරිපාලනමය කටයුතු සිදු කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම නවක උපාධිධාරීන් සඳහා පුහුණු කාලසටහනක් ඔස්සේ පුහුණු වැඩසටහන් 10කට ආසන්න සංඛ්‍යාවක් පවත්වන ලදි. අමාත්‍යාංශයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍යතාවය පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමද 2021 වර්ෂයේදී සිදුකළ අතර 2021 වසර අවසන් වනවිට අමාත්‍ය මණ්ඩල සංදේශ 15 ක් යොමු කොට ඉදිරි පියවර ගෙන ඇත. එසේම පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, තැපෑල අංශවලට බෙදාහැරීම, පිටතට යැවෙන ලිපි තැපැල් කිරීම, සැපයුම් හා සේවා පවත්වාගෙන යාම, වාහන සංචිතය පවත්වාගෙන යෑම, වාහන, ගොඩනැගිලි හා උපකරණ නඩත්තු කටයුතු ආදිය 2021 වර්ෂයේදී ද අවශ්‍යතාවය අනුව සිදු කරන ලදි.

ගිණුම් අංශය

2021 අයවැය ඇස්තමේන්තු අනුව මූල්‍ය කළමනාකරණය සිදු කරමින් අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසින් 2021 වර්ෂයේදී ද තම කාර්යයන් ඉටු කරන ලදී. අමාත්‍යාංශයෙන් අක්මුදල් අවශ්‍යතාවයන් අනුව භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම, මුදල් පොත පවත්වාගෙන යෑම හා තුලනය කිරීම, මූල්‍ය ගෙවීම් සිදු කිරීම, වැටුප් ගෙවීම් කළමණාකරණය

කරමින් Payroll ලෙජරයන් පවත්වාගෙන යෑම , රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධ කටයුතු සිදු කිරීම, පොදු තැන්පතු ගිණුම සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් ගිණුම් අංශය යටතේ සිදු කරනු ලබයි. මෙයට අමතරව අමාත්‍යාංශයේ සියළුම ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ රාජකාරී ඉටු කරමින් 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන 91 ක් නිම කරන ලදී. එසේම වත්කම් කළමනාකරණය කරමින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම, භාණ්ඩ සමීක්ෂණ, හානි පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම, ආදායම් එකතු කිරීම සම්බන්ධ කටයුතු සිදු කරන ලදී. මූල්‍ය වාර්තාකරණය ගිණුම් අංශය විසින් සුවිශේෂීව ඉටු කරනු ලබන කාර්යයක් වන අතර ITMIS පද්ධතිය ක්‍රියාත්මක කිරීම, CIGAS පද්ධතිය ක්‍රියාත්මක කිරීම, PMS පද්ධතිය සම්බන්ධ කටයුතු සිදු කිරීම, මාසික ගිණුම් සාරාංශ, මාසික වියදම් වාර්තා මහා භාණ්ඩාගාරයට යොමු කිරීම 2021 වර්ෂයේදී ද නියමිත කාල වකවානු තුළ ඉටු කරන ලදී.

සංවර්ධන අංශය

අමාත්‍යාංශයට අයත් සංවර්ධන අංශය මඟින් තේ හා රබර් ක්ෂේත්‍රයට අදාළ සියළුම පාර්ශවයන් සම්බන්ධීකරණය කරමින් වාර්ෂික පුහුණු දින දර්ශනය සකස් කර ප්‍රකාශයට පත් කිරීම 2021 වර්ෂයේ සිදු කරන ලද සුවිශේෂී කාර්යභාරයකි. තව ද තේ හා රබර් ක්ෂේත්‍රයේ පනත් හා රෙගුලාසි සංශෝධනය කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ශ්‍රී ලංකා රබර් කර්මාන්ත සංවර්ධන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම සහ රබර් මහ සැලැස්ම අධීක්ෂණය සඳහා පත් කරන ලද කමිටුවට අදාළ රාජකාරී සිදු කිරීම සංවර්ධන අංශය මඟින් සිදු කරන ලදී. එසේම අන්තර්ජාතික සංවිධාන සහ කාර්යසාධන බලකාය සඳහා දායකත්වය ලබා දෙමින් අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, සංඛ්‍යා ලේඛන යාවත්කාලීන කිරීම, මහජන පැමිණිලි සඳහා ක්‍රියාමාර්ග ගැනීම හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල වාර්ෂික වාර්තා සම්බන්ධ කටයුතු සිදු කිරීම 2021 වර්ෂයේදී ද සංවර්ධන අංශය විසින් ඉටු කරන ලදී.

වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය

ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක ස්වර්ණමය කොටස්කරු වශයෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරී ඇති බලතල රාජ්‍ය අංශය වෙනුවෙන් මෙහෙයවීම වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ කාර්යභාරය වේ. මෙම අංශය මඟින් 2021 වර්ෂය තුළ ඉටු කළ කාර්යයන් අතර සමාගම් වෙතින් රු.මි. 1,086.932ක බදු කුලී අයකර ගැනීම, වැවිලි සමාගම් පාලනය කරනු ලබන ඉඩම් උප බදු දීමෙන් රු.මි. 10.01ක මුදලක් අයකර ගැනීම, වැවිලි සමාගම්වල ලාභ අලාභ පිළිබඳ මූල්‍ය දත්ත පද්ධති පවත්වා ගැනීම, වතු සමාගම්වල ප්‍රගතිය විමසීම සඳහා ස්වර්ණමය කොටස් හිමිකාරීත්වය යටතේ වන රැස්වීම් 23ම පවත්වා අදාළ උපදෙස් ලබා දීම හා උපායමාර්ග සැලසුම් ලබා ගැනීමට කටයුතු කිරීම, දැව හෙළීමේ කටයුතු අධීක්ෂණය මඟින් වතු 51 සඳහා අනුමැතිය ලබා දීම, ක්ෂේත්‍ර පරීක්ෂණ 13ක් සිදු කර අදාළ වාර්තා පිළියෙල කිරීම වැනි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. තව ද වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය මඟින් වතු ඉඩම්වල වට මැනුම් සිදු කර

සිතියම්ගතකිරීමේ ව්‍යාපෘතිය හරහා කොට්ඨාශ 87ක මැනුම් අවසන් කොට ඇත. එසේම දේශීය කිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා ඉඩම් හඳුනා ගැනීම, වෙන් කිරීම, ආයෝජන හඳුනා ගැනීම හා ආයෝජකයින් සඳහා පහසුකම් සැපයීමේ විශේෂ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා අදාළ අනෙකුත් ආයතන සමඟ ක්‍රියාවට නැංවීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

තාක්ෂණික අංශය

මෙම අමාත්‍යාංශය යටතේ ඇති තාක්ෂණික අංශය මඟින් තේ හා රබර් ක්ෂේත්‍රයේ පොහොර සම්බන්ධව මැදිහත්වීම් සහ සම්බන්ධීකරණය සිදුකිරීම, තේ හා රබර් ක්ෂේත්‍රයේ රෝග පාලන කටයුතු සඳහා අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය සහාය සැපයීම, වන සංරක්ෂණ ඉඩම් රබර් වගාව සඳහා යොදා ගැනීම සම්බන්ධ කටයුතු සිදු කිරීම හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය වැනි රාජකාරි 2021 වර්ෂයේදී ඉටු කරන ලදි.

2022 වර්ෂයේ අමාත්‍යාංශයේ ඉදිරි දැක්ම

තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වන ඉදිරි වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී ගෝලීය කොවිඩ් තත්ත්වය මෙන්ම දේශගුණික විපර්යාස තුළ යම් සීමාකම් පැවතිය ද 2022 වර්ෂයේදී අභියෝග ජය ගනිමින් තේ නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කරමින් තේ නිෂ්පාදන ඉලක්කය වන මෙ.ටො. 325,000 ක් දක්වා ඉහළ නැංවීමත් වාර්ෂික තේ අපනයන ආදායම රු.මි. 302,000 දක්වා ඉහළ නැංවීමත් ප්‍රධාන ඉලක්කයන් කර ගනිමින් සෘජු තේ වගා ක්‍රමවේදය යටතේ තේ වගාව, කොම්පෝස්ට් නිෂ්පාදන ඒකක සංවර්ධනය, නැවත වගා නව වගා සහනාධාරය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, කුඩා තේ වතු හිමියන් ශක්තිමත් කිරීම සඳහා ඵලදායිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, තේ වගාව සඳහා ජලසම්පාදන ක්‍රම ක්‍රියාත්මක කිරීම, තේ තවාන් සංවර්ධනය, සෙවණ ශාක ස්ථාපනය කිරීම, තේ වගා ක්ෂේත්‍රය යාන්ත්‍රීකරණය, ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීම උදෙසා නව තාක්ෂණයෙන් යුතුව තාක්ෂණික සේවා පුළුල් කිරීම හා පුහුණු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම වැනි ව්‍යාපෘති සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකාවේ රබර් වගාව හා නිෂ්පාදනය මෙ.ටො. 88,500 දක්වා ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා 2022 වර්ෂයේදී ද ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කොට ඇත. රබර් නැවත වගාව හා නව වගාව සඳහා සහනාධාර ලබාදීම අඛණ්ඩව සිදු කිරීම, අතුරු භෝග වගාව, පුහුණු වැඩසටහන් සිදු කිරීම, දුම් ගෙවල් ඉදිකිරීම, රබර් ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා උපකරණ ලබා දීම, කුඩා රබර් වතුහිමියන් ශක්තිමත් කිරීම සඳහා ඵලදායිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පත්‍ර පතන රෝග පාලනය කිරීම, රබර් පැළ තවාන් සංවර්ධනය, රබර් ෂීට් සැකසුම් ඒකක පිහිටුවීම, රබර් වගාව සඳහා ජල සම්පාදනය, රබර් වෙන්දේසි ක්‍රමය ආරම්භ කිරීම හා රබර් නිෂ්පාදන ආශ්‍රිත ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානය යොමු කොට ඇත.

ඉහතින් සඳහන් කරන ලද තේ හා රබර් වගාවන් ආශ්‍රිතව මුහුණ දෙන විවිධාකාර අභියෝග ජය ගනිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය මනාලෙස කළමනාකරණය හා මෙහෙයවීම තුළින් අපේක්ෂිත ජාතික ඉලක්ක ළඟා කර ගැනීම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය තහවුරු කරමින් තේ හා රබර් ක්ෂේත්‍රය 2022 වර්ෂයේදී ද දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට කැපී පෙනෙන දායකත්වයක් සපයනු ඇත.

සී. සී. මුහන්දිරම්ගේ
අතිරේක ලේකම් (රබර් වගා සහ සමාගම්වතු ප්‍රතිසංස්කරණ)

සී. සී. මුහන්දිරම්ගේ
අතිරේක ලේකම්
සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත සෝප වගා සහ
කර්මාන්තශාලා සංවර්ධනය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
08 වන මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල.

03 පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	තත්‍ය නැවත ගලපන ලද 2021	2020	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,212,020,000	12,800,000	ඒසිඒ-3
-	තැන්පතු		1,253,636	1,550	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		3,967,883	302,440	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			130,139	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,217,241,519**	13,234,129	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ= (අ)+(ආ)**		**1,217,241,519**	13,234,129	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		71,948,533	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,145,292,986	13,234,129	
	අඩු කළා වියදම් :				
	පුනරාවර්තන වියදම්				
	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක	5	54,224,039	10,624,175	
76,051,000	ප්‍රතිලාභ				
52,819,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	49,668,565	5,818,734	ඒසිඒ-2(ii)
945,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	895,633,623	884,811,000	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,074,170,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**999,526,227**	901,253,909	

	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා	10	66,359,648	625,985	
89,530,000	වැඩිදියුණු කිරීම්				
14,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	11,065,912	4,059,187	
3,195,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	2,673,308,434	2,392,125,506	ඒසිඒ -2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
700,000	හැකියා වර්ධනය	14	587,950	-	
1,150,500,000	වෙනත් මූලධන වියදම්	15	394,682,474	197,715,752	
4,450,030,000	**මුළු මූලධන වියදම් (උ)**		**3,146,004,418**	2,594,526,430	
	තැන්පතු ගෙවීම්		604,982	-	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		6,438,046	6,012,863	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		7,043,028	6,012,863	
				-	
	මුළු වියදම් එ=(ඊ+උ+ඌ)		4,152,573,673	3,501,793,202	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)**		(3,007,280,687)	(3,488,559,073)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(3,007,280,687)	(3,488,559,073)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	**රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	19,117,698	6,035,687
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,180,585	5,710,423
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**27,298,283**	**11,746,110**

<u>ශුද්ධ වත්කම් ස්කන්ධය /</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		7,530,382	5,708,873
දේපළ පිරියත හා උපකරණ සංචිතය		19,117,698	6,035,687
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ- 4	650,203	1,550
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**27,298,283**	**11,746,110**

පිටු අංක 1 සිට 30 දක්වා ඒසීඒ එෆ් සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී
නම : බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති	නම :	නම : ඩී. එම්. එම්. දිසානායක
තනතුර : ලේකම්	තනතුර :	තනතුර : ප්‍රධාන ගණකාධිකාරී
දිනය : 2022.06.29	දිනය :	දිනය : 2022.06.29

ජානක ධර්මකීර්ති
ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
11 වන මහල, සෙත්සිරිපාය II වන අදියර
බත්තරමුල්ල.

ඩී. එම්. එම්. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත හෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
08 වන මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
මුළු බදු ලැබීම්		-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,289,188	130,138
අග්‍රිම ලැබීම්	1,212,020,000	12,800,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,674,888	1,052,283
තැන්පතු ලැබීම්	1,253,635	1,550
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,221,237,711**	**13,983,971**
අඩුකළා මුදල් වැය කිරීම් :		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	91,841,265	7,327,044
සහනාධාර සහ මාරුකිරීම්	278,623	141,411
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	100,000,000	25,855
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	71,948,533	-
අත්තිකාරම් ගෙවීම්	6,190,881	2,273,035
තැන්පතු ගෙවීම්	604,982	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**270,864,284**	**9,767,345**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**950,373,427**	**4,216,626**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා මුදල් වැය කිරීම් :		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	950,373,427	4,216,626
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**950,373,427**	**4,216,626**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(950,373,427)**	**(4,216,626)**

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩු කළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) =(උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000,

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000,

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,076,200	1,074,170	999,526	93%
ප්‍රාග්ධන	3,464,500	4,450,030	3,146,004	71%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000,

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	වෙළෙඳ අමාත්‍යාංශය	රබර් පර්යේෂණ ආයතනය මඟින් සිදු කරනු ලබන Facilitate Establishment of a Research Facility for Tire testing and Development by the private sector ව්‍යාපෘතිය සඳහා	50,000	50,000	50,000	100%
02.	සමෘද්ධි, ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	සමෘද්ධි පවුල් ලක්ෂ 2ක් සවිබල ගැන්වීම 2021 දිළිඳුකම පිටුදැකීම උදෙසා වැවිලි කර්මාන්ත හා සමෘද්ධි ඒකාබද්ධ ව්‍යාපෘතිය	50,000	50,000	50,000	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000,

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	19,117,698.44	19,117,698.44		100%
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම 01 මඟින් දැක්වේ.

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	75% - 89%	50% - 74%
1.	වර්ෂය තුළ අවසන් කරන ලද පෞද්ගලික ලිපි ගොනු සංඛ්‍යාව (ලිපි ගොනු 88)	√		
2.	වර්ෂය තුළ අවසන් කරන ලද වාර්ෂික කාර්යසාධන ඇගයුම් පත්‍ර ගණන (කාර්යසාධන ඇගයුම් පත්‍ර 88)	√		
3.	අවශ්‍යතාවයන් පරිදි වර්ෂය අවසන් වන විට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන (සංදේශ 15)	√		
4.	වර්ෂය අවසන් වන විට පවත්වා ඇති ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන (රැස්වීම් 12)	√		
5.	වර්ෂය තුළ අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් ගණන (ක්‍රියාකාරී සැලසුම් 8)	√		
6.	තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සම්බන්ධීකරණය කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (ව්‍යාපෘති 20)	√		
7.	වර්ෂය තුළ පිළිතුරු සපයන ලද විගණන විමසුම් ගණන (විගණන විමසුම් 4)	√		
8.	මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා ගණන (වාර්තා 53)	√		
9.	වර්ෂය තුළ නිමකරන ලද ප්‍රසම්පාදන සංඛ්‍යාව (ප්‍රසම්පාදන 91)	√		
10.	ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් වර්ෂයේදී අයකරන ලද බදු කුලී ප්‍රමාණය (රු.මි.769.912)	√		
11.	වතු සමාගම්වල ප්‍රගතිය විමසීම සඳහා පවත්වන ලද ස්වර්ණමය කොටස් හිමිකාරීත්වය යටතේ (Golden Shared Holder meeting) වන රැස්වීම් සංඛ්‍යාව (රැස්වීම් 23)	√		
12.	තේ සහ රබර් දෙඅංශයේ පොහොර අවශ්‍යතාවය සපුරාලීමට සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් ගණන (ක්‍රියාකාරකම් 34)	√		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
G2	වසර 2030 වනවිට ඵලදායිතාව සහ නිෂ්පාදනය වැඩි කරන, පරිසර පද්ධති නඩත්තු කිරීමට උපකාරී වන, දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමේ ධාරිතාව ශක්තිමත් කරන, නියඟය, ගංවතුර හා වෙනත් ආපදා වැනි ආන්තික කාලගුණික සිදුවීම් සහ ක්‍රමානුකූලව ඉඩම් සහ පාංශු ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්නා වූ ඔරොත්තු දෙන කෘෂිකාර්මික භාවිතයන් ක්‍රියාත්මක කිරීම තුළින් තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම සහතික කිරීම	1. තේ හා රබර් ක්ෂේත්‍රයේ නව වගාව, නැවත වගාව හා පාළු සිටුවීම සාපේක්ෂ ව ඉහළ අගයක පවත්වාගෙන යාම (හෙක්.)			√
		2. නිෂ්පාදන ඵලදායිතාව සාපේක්ෂව ඉහළ නැංවීම (කි.ග්‍රෑම් මිලි.)		√	
		3. පසේ PH අගය හා පාංශු තත්ත්ව පිළිබඳ ව පරීක්ෂණ සිදුකිරීම (සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව)		√	
		4. ගුණාත්මකභාවයෙන් ඉහළ පැළ නිෂ්පාදනයක් සිදු කිරීම (පැල සංඛ්‍යාව)			√
		5. කාලගුණික විපර්යාසවලට ඔරොත්තු දීම සඳහා සෙවණ පැළ නිෂ්පාදනය (පැල සංඛ්‍යාව)			√
		6. ජෛව විවිධත්වය ඇති කිරීම සඳහා අතුරු භෝග වගාව (හෙක්.)		√	
		7. කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා කාබනික පොහොර සැකසුම් මධ්‍යස්ථාන ඉදි කිරීම (මධ්‍යස්ථාන 8)			√
G12	වසර 2030 වනවිට පසු අස්වනු හානි ඇතුළු ව නිෂ්පාදන හා සැලසුම් දාමයන් හි සිදුවන්නාවූ අපතේ යාම අවම කිරීම	1. තේ පර්යේෂණායතයේ නිෂ්පාදිත සැහැල්ලු තේ කූඩ ගොවීන් වෙත ලබා දීම (කූඩ සංඛ්‍යාව)			√
		2. ප්‍රවාහනයේ දී වන අස්වනු හානිය අවම කිරීම සඳහා විශේෂිත බහාලුම් ලබාදීම (බහාලුම් සංඛ්‍යාව)		√	
		3. කළු තේ සකස් කිරීමේදී වන අපතේ යාම වැළැක්වීම සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සඳහා යන්ත්‍ර සූත්‍ර සවි කිරීම (යන්ත්‍ර ගණන 9)			√

G15	වන සංරක්ෂණ තෙත්බිම්, කඳු හා වියළි බිම් සංරක්ෂණය කිරීම ප්‍රතිස්ථාපනය සහ තිරසාර අන්දමින් භාවිත කිරීම් තහවුරු කිරීම	1. සමාගම් වතු සඳහා දැව හෙළීම් කටයුතු පාලනය කරමින් අධීක්ෂණය කිරීම (ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව)			√
		2. වන කළමනාකරණ සැලැස්මකට අනුව වන වගාව සිදු කිරීම අධීක්ෂණය කිරීම (අධීක්ෂණය කරන ලද වතු ගණන)			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන සභාව මඟින් වැවිලි ක්ෂේත්‍රයට අදාළව තිරසර සංවර්ධන අරමුණු 3ක් හඳුනාගෙන ඇති අතර එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූල වෙමින් 2030 වර්ෂය වන විට තේ හා රබර් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයක් සහිතව තිරසාර භෝග නිෂ්පාදනය හා අපනයන රටාවක් තහවුරු කිරීම සඳහා පියවර රැසක් මේ වන විට දියත්කර ඇත.

තිරසර සංවර්ධන ඉලක්කය 2 පරිදි තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම සහතික කිරීම සඳහා ගෝලීය කොවිඩ් අර්බුදය හමුවේ වුවද තේ හා රබර් ක්ෂේත්‍රයේ නව වගාව, නැවත වගාව හා පාළු සිටුවීම් සාපේක්ෂව ඉහළ අගයක පවත්වාගෙන යමින් 2021 වර්ෂයේදී තේ නිෂ්පාදනය කි.ග්‍රෑ.මි.299ක් හා රබර් නිෂ්පාදනය මෙ.ටො. 76,884ක් සිදුකර ඇත. එසේම තේ හා රබර් ප්‍රධාන අපනයන බෝගයන් වශයෙන් එහි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නංවමින් 2021 වර්ෂයේදී තේ කි.ග්‍රෑ.මි. 286ක් අපනයනය කොට ආදායම ලෙස රු.බි. 263ක් ද, ස්වභාවික රබර් කි.ග්‍රෑ.මි.84.623 ක් අපනයනය කොට ආදායම ලෙස රු.බි. 217.352 ක් ද ලෙස ජයග්‍රහණ ලබා ඇත.

ජල සුරක්ෂිතතාව, පොහොර භාවිතය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගනිමින් පසේ වයනය, PH අගය හා පාංශු තත්ත්ව පිළිබඳ ව පරීක්ෂණ සිදුකරමින් සංරක්ෂණ ක්‍රමවේදයන්, තේ හා රබර් වගාවේ ක්‍රියාත්මක කරනු ලබන අතර කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා කාබනික පොහොර සැකසුම් මධ්‍යස්ථාන 8ක් ස්ථාපිත කරන ලදී. ගුණාත්මක පැළ නිෂ්පාදනයක් සිදු කිරීම සඳහා තේ තවාන් 781ක් ලියාපදිංචි කොට පැළ මිලියන 22.9ක් ද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සතු තේ පැළ තවාන් 11ක් මඟින් පැළ මිලියන 1.5ක් ද, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් රබර් පැළ මිලියන 1.093ක් ද, නිපදවන ලදී. එසේම කාළගුණික විපර්යාසයන්වලට ඔරොත්තුදීම සඳහා උස් සෙවණ පැළ 556,000ක් නිෂ්පාදනය කිරීම ද ඉෙව විවිධත්වය ඇති කිරීම සඳහා ගම්මිරිස්, පුවක්, වැනිලා, අන්නාසි, පැඟිරි, බඩඉරිඟු වැනි අතුරු භෝග වගාව ද, සිදුකර ඇත. මීට අමතරව කුකුල් පාලනය, බිම්මල් වගාව, මී මැසි පාලනය, කෘෂි අපනයන භෝග වගාව, අන්නාසි වගාව හා ඇන්තූරියම් වගාව වැනි විශේෂ ව්‍යාපෘති මඟින් තේ හා රබර් වගාකරුවන්ගේ වගා ඒකකවල විවිධාංගීකරණය ඇති කිරීම තුළින් ආර්ථිකය නඟා සිටුවීම සඳහා 2021 වර්ෂයේදී රු.මි.100ක පමණ වියදමක් දරමින් ඉෙව විවිධත්වය තහවුරු කර ඇත.

12 වන තිරසර සංවර්ධන ඉලක්කයට අනුගතව වසර 2030 වන විට පසු අස්වනු හානි ඇතුළු ව නිෂ්පාදන හා සැලසුම් දාමයන් හි සිදුවන්නාවූ අපතේ යාම අවම කිරීම් සඳහා, තේ පර්යේෂණායතයේ නිෂ්පාදිත සැහැල්ලු තේ කූඩ ගොවීන් වෙත ලබා දීම, ප්‍රවාහනයේ දී වන අස්වනු හානිය අවම කිරීම සඳහා විශේෂිත බහාලුම් ලබා දීම 2021 වර්ෂයේදී ද සාර්ථකව සිදු කරන ලදී. තව ද, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව වෙත නවීනතම යන්ත්‍රෝපකරණ සවි කිරීම, කුඩා රබර්වතු හිමියන් සඳහා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 29ක්

සකස් කිරීම, කිරි කෝප්ප රඳවන, පෙණ පතුරු හා කිරි පෙරන ලබා දීම වැනි විශේෂ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරමින් නිෂ්පාදන දාමයන්හී සිදුවන අපතේ යාම අවමකොට ඇත.

15 වන තිරසර සංවර්ධන ඉලක්කය යටතේ සමාගම් වතුවල පවතින වන සංරක්ෂණ තෙත්බිම්, කඳු හා වියළි බිම් සංරක්ෂණය කිරීම ප්‍රතිස්ථාපනය සහ තිරසාර අන්දමින් භාවිත කිරීම් තහවුරු කිරීම සඳහා සමාගම් වතු සඳහා දැව හෙළීම් කටයුතු පාලනය කරමින් අධීක්ෂණය කිරීම හා වන කළමනාකරණ සැලැස්මකට අනුව වන වගාව සිදු කිරීම අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කළ අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් තෝරාගත් ඉඩම්වල රබර් පැළ වගා කිරීමේ කටයුතු සිදු කරමින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ ලබා ඇත. එසේම ඇල්කඩුව වැවිලි සමාගම මඟින් වාණිජමය වටිනාකමක් සහිත දැව ප්‍රභේදයන් සහ මී, කුඹුක්, කිතුල් සහ එරබදු වැනි පාරිසරික වටිනාකමක් සහිත පැළ 100,000ක් සිටුවීමට කටයුතු කර ඇත. කුඩා තේ හා රබර්වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ සමස්ථ ඉලක්කය වූ රබර් වගාවට සාම්ප්‍රදායික නොවන අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කයන්හී හෙක්ටයාර 3,000ක නව රබර් වගාවන් ස්ථාපිත කිරීමේ කටයුතු 2021 වසරේදී නිමා කරන ලදී.

මෙසේ තිරසර ඉලක්ක සපුරා ගැනීමේදී මෙම අමාත්‍යාංශයට විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. විශේෂයෙන් ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හා විවිධ රටවල මතුවන ආර්ථික අර්බුද මෙන්ම ස්වභාවික ආපදාවන්ගෙන් මතුවන බාධා, ප්‍රාග්ධන ව්‍යාපෘති හා පර්යේෂණ දිරිගැන්වීම සඳහා වන ප්‍රතිපාදන සපයා ගැනීමේ සීමාවන් උදාහරණ වශයෙන් දැක්විය හැකිය. තිරසර සංවර්ධන ඉලක්ක කරා යෑමේදී විවිධ පර්යේෂණවල ප්‍රතිඵලයන් ප්‍රායෝගිකව ක්ෂේත්‍රයේ යොදා ගැනීමේදී ඇතිවන ගැටළු ද සෘණාත්මක බලපෑම් ඇති කරනු ලබයි.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	18	10	08
තෘතීයික	01	-	01
ද්විතියික	58	34	23
ප්‍රාථමික	14	13	01
කොන්ත්‍රාත්/අනියම්	-	-	-

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටුකරලීම වෙනුවෙන් ඉලක්කගත අරමුණුවලට ළඟාවීමේ දී මානව සම්පත් හිඟය සෘජු බලපෑමක් සිදු කරන ලද අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වැයවන කාල සීමාවන්හි දීර්ඝ වීමක් සිදු විය. අමාත්‍යාංශය සඳහා අනුමත කාර්යමණ්ඩලයෙන් 2021 වසර අවසානය වනවිටත් 38%ක් පුරප්පාඩු පැවතිනි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
නවක උපාධිධාරීන් හා සංවර්ධන නිලධාරින් සඳහා ධනාත්මක ආකල්ප වර්ධනය තුළින් රාජ්‍ය සේවයේ සෞභාග්‍ය පිළිබඳ පුහුණු පාඨමාලාව 2021.10.22	42	පැය 3 මිනිත්තු 30	66,500	-	දේශීය	නවක උපාධිධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ ධනාත්මක ආකල්ප වර්ධනය
නවක උපාධිධාරීන් ,සංවර්ධන නිලධාරින් ,කළමනාකරණ සහකාර නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන 2021.10.27	55	පැය 3	31,450	-	දේශීය	රාජ්‍ය සේවය සම්බන්ධයෙන් හා අමාත්‍යාංශයේ කාර්යභාරය පිලිබඳ හසල දැනුමක් ලැබීම

වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ සංවර්ධන නිලධාරීන් ඇතුළු පිරිස සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන	25	පැය 5 මිනිත්තු 30	17,675	-	දේශීය	ප්‍රාදේශීය වැවිලි සමාගම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එම කාර්යයන් කඩිනමින් හා බාධාවකින් තොරව ඉටු කිරීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් හා ඒ හා සම්බන්ධ අණපනත් චක්‍රලේඛ පිළිබඳ අවබෝධයක් ලැබීම.
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් මෙහෙවනු ලැබූ පාඨමාලා 1. කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි 2. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 3. පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායීව සකස් කිරීම 4. රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	28	මාර්ගගත ක්‍රමය ඔස්සේ	240,500	-	දේශීය	අදාල පාඨමාලා හැදෑරීම තුළින් නිලධාරීන් හට දැනුම ලබා ගැනීමටත් පවතින දැනුම වර්ධනය කර ගැනීම තුළින් කාර්යක්ෂමව රාජකාරි කටයුතු කිරීමට හැකියාව ලැබීම.
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙහෙයවනු ලැබූ පාඨමාලා 1. ආකල්ප සංවර්ධනය, කාර්යාල ක්‍රම හා ලිපිගොනු නඩත්තුව 2. රාජකාරි ලිපි සැකසීම 3. තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටුවලින් සිදුවන දුර්වලතා හා ප්‍රමාදයන් අවම කර ගැනීම 4. රාජ්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය ආයතන සංග්‍රහයේ විධිවිධාන රාජ්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය මූල්‍ය රෙගුලාසි ආශ්‍රයෙන් ගිණුම් ක්‍රම 5. MS WORD 6. MS EXCEL	36	මාර්ගගත ක්‍රමය ඔස්සේ	150,000	-	දේශීය	අදාළ පාඨමාලා හැදෑරීම තුළින් නිලධාරීන් හට දැනුම ලබා ගැනීමටත් පවතින දැනුම වර්ධනය කර ගැනීම තුළින් කාර්යක්ෂමව රාජකාරි කටයුතු කිරීමට හැකියාව ලැබීම.

රාජ්‍ය මුල්‍ය කළමනාකරණය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව- ශ්‍රී ලංකා පදනම් ආයතනය	02	පැය 6	16,000	-	දේශීය	ගිණුම් අංශයට අදාළ රාජකාරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීමට හැකි වීම.
රාජකාරි ලිපි සැකසීමේදී අනුගමනය කළ යුතු උපදෙස් - ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	28	පැය 03	5000	-	දේශීය	රාජකාරි ලිපි සැකසීමේදී අවශ්‍ය දැනුම ලබාගැනීම තුළින් කාර්යක්ෂම සේවයක් ඉටු කිරීමට හැකිවීම.
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය- පැය 200 දෙවන භාෂා පාඨමාලාව	1	පැය 200 - මාර්ගගත ක්‍රමය ඔස්සේ	15,000	-	දේශීය	වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දෙමළ භාෂා දැනුම ලබා ගැනීම.

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන අයුරු**

අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම තුළින් අමාත්‍යාංශය තුළ තමන්ට නියම වී පවතින රාජකාරී වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද නිලධාරීන් පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම තුළින් ලබන අත්දැකීම් තම රාජකාරියට අනුකූල කර ගැනීම හා එමඟින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම මෙන්ම නිලධාරීන් අභිප්‍රේරණය වන අතර, ඒ තුළින් ලබා ගන්නා දැනුම හා කුසලතා උපයෝගී කර ගනිමින් තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇති කරලීමට හැකියාව ලැබෙනු ඇත.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිගත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.6	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1- 2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයට අභ්‍යන්තර විගණකවරයෙකු ගේ පුරප්පාඩුවක් පවතින බැවින් මෙම වාර්තා සකස්කිරීමට නොහැකි විය.	අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයට අභ්‍යන්තර විගණකවරයෙකු ගේ පුරප්පාඩුවක් පවතින බැවින් එක් කළමනාකරණ කමිටුවක් පමණක් පැවැත්වීමට හැකිවිය.	අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	පුහුණු නිලධාරී හිඟකම සහ පුරප්පාඩු පැවතීම	ඉදිරියේදී ප්‍රමාදයන් මඟහරවා ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් යෙදීම
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	-	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	සංචිතය සතු වාහන ප්‍රමාණය අවම බැවින් මෙම පරීක්ෂාව සිදු කර ගැනීමේ ප්‍රායෝගික ගැටලු පැවතීම	ඉදිරියේදී ප්‍රමාදයන් මඟහරවා ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් යෙදීම
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ	තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතීම	ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කිරීම
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	රාජ්‍ය අමාත්‍යාංශය මෑතකදී ස්ථාපිත බැවින් සුදුසු වැඩපිළිවෙළක් සැකසීමට ප්‍රමාද වීම	ඉදිරියේදී ප්‍රමාදයන් මඟහරවා ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සැකසීම
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	රාජ්‍ය අමාත්‍යාංශය මෑතකදී ස්ථාපිත බැවින් සුදුසු වැඩපිළිවෙළක් සැකසීමට ප්‍රමාද වීම	ඉදිරියේදී ප්‍රමාදයන් මඟහරවා ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සැකසීම

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	පුහුණු නිලධාරී හිඟකම සහ පුරප්පාඩු පැවතීම	පවත්නා මානව සම්පත් යොදා ගනිමින් ඉදිරියේදී මානව සම්පත් සැලැස්ම සම්පාදනයට කටයුතු කිරීම
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		